ද මැසිනොද් විදුහල - කඳාන

# De Mazenod College – Kandana

දෙවන වාර පරීක්ෂණය - 2018

පෙරදිග සංගීතය I

13 ශ්‍රේණිය | කාලය: පැය 2 යි

2.04.2018
9 Pages.

## I - පත්‍රය

(1) සංගීතය හා නර්තනය වන කලාවන් තුළ පොදුවේ පවතින සංගීත මූලධර්මය වන්නේ,

(i) සෙලරාග ක්‍රමයයි (ii) රාගතාලයි (iii) රිද්මයයි

(iv) ස්වරයයි (v) අභිනයයි (___)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(2) උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවලට අයත් මේල සංඛ්‍යාව පිළිවෙලින්,

(i) 10 - 78 (ii) 20 - 18 (iii) 10 - 72

(iv) 64 - 78 (v) 12 - 72 (___)

(3) ම-ස ස්වර දෙක වාදී - සංවාදී වශයෙන් යොදා **නොගන්නා** රාගය වන්නේ,

(i) මාල්කෞන්ස්ය (ii) බහාර්ය (iii) ජයජයවන්තිය

(iv) භාගේශ්‍රීය (v) භීම්පලාසිය (___)

(4) තීලවඩා හා ත්‍රිතාලයට අයත් මාත්‍රා සංඛ්‍යාව පිළිවෙලින් දක්වන්න.

(i) 15 - 16 (ii) 16 - 12 (iii) 16 - 16 (iv) 18 - 16 (v) 12 - 16 (___)

(5) චෞතාලය භාවිත වන්නේ කුමන ගායන ශෛලියකට ද ?

(i) ඨුම්රි (ii) ධ්‍රැපද් (iii) පංජාබි (iv) ඛ්‍යාල් (v) භජන් (___)

(6) විවිධ තාල රූප සහ දොහොරාවක් සහිත වූ නූර්ති ගීය කුමක්ද ?

(i) ආරන්තේ ඉන්නා (ii) හරිමි රජ සැපා (iii) දන්නෝ බුදුන්ගේ

(iv) ශ්‍රියා මනමත්වී v) වාසනා දිනේකි මේක (___)

(7) ශාස්ත්‍රීය ගායනයක් ඉදිරිපත් කිරීමේදී යොදා ගැනීම සඳහා සුදුසු භාණ්ඩ යුගලය වන්නේ,

(i) බටනලාව සහ වයලීනය

(ii) තාම්පුරාව හා තබ්ලාව

(iii) තබ්ලාව හා බටනලාව

(iv) තාම්පුරාව හා සිතාරය

(v) වයලීනය හා තාලම්පට (___)

(8) ගීයක් අවග්‍රහයෙන් ගැයීම නම්,

(i) තාලයේ මුල් මාත්‍රාව හිස් කොට දෙවන මාත්‍රාවට ඇඳා ගැයීම

(ii) තාලයෙන් තොරව ගායනා කිරීම

(iii) නියමිත ලයෙන් බැහැරව ගැයීම

(iv) ගීයක් අන්තරා කොටසින් ආරම්භ කිරීම

(v) ගීයක් නියමිත තනුවෙන් බැහැරව ගැයීම (___)

(9) පහත සඳහන් මූලික කෝඩ්ස් (Chords) තුනට අයත් සමහර ස්වර සටහන් වී නොමැත.

ස - ප පනි - - ධස

එම ස්වර පිළිවෙලින්,

(i) ග, රි, ම (ii) රි, ම, ග (iii) ග, ම, රි (iv) ම, ග, රි (v) රි, ග, ම (___)

(10) සරල ගීත ගායන, ශාස්ත්‍රීය ගායන - වාදන, විවිධ සංගීත නිර්මාණ ආදිය කෙරෙහි එක සේ ප්‍රශස්ත දායකත්වයක් ලබා දී ඇත්තේ,

(i) සුනිල් ශාන්ත සූරින් ය (ii) ආනන්ද සමරකෝන් සූරින් ය

(iii) ඩබ්ලිව්.බී. මකුලොලුව සූරින් ය (iv) ලයනල් අල්ගම සූරීන් ය

(v) පණ්ඩිත් අමරදේව සූරින් ය (___)

(11) ගීතයක හෝ වාදිතයක හෝ ආරම්භයේ සිට සමස්ථානය දක්වා ගැයෙන - වැයෙන කොටස නම් කරන්න.

(i) ආලාප (ii) උපජ් (iii) මුඛඩා (iv) තිහායි (v) ස්ථායි (___)

(12) ප්‍රශස්ති ගීත හා බැඳුණු සුවිශේෂ ලක්‍ෂණයකි.

(i) ඉන්නිසය (ii) තෝඩායම (iii) මුදුප්පද (iv) අඩව්ව (v) ඉරට්ටිය (__)

(13) සරෝද්, සාරංගි, වයලීන් වැනි තත් භාණ්ඩ වාදනයේ දී එක් ස්වරයක සිට තවත් ස්වරයකට හඬ නොකඩවා පවත්වාගනිමින් හඬ පාලනය සහිතව කරනු ලබන වාදනය හැඳින්වීමට සුදුසු නම කුමක්ද?

(i) මන්ඩ් (ii) උපජ් (iii) සූත් (iv) ස්වර මාලිකා (v) ගමක් (___)

(14) උත්තර භාරතීය - දක්‍ෂිණ භාරතීය සංගීත පද්ධති දෙකටම අදාළ කළ හැකි තොරතුරු තෝරන්න.

(i) භාෂාව - තාල පද්ධතිය - සංගීත භාණ්ඩ සමානය

(ii) ශුද්ධ හා විකෘති ස්වර (12) ක් යොදා ගැනේ

(iii) ගීත ආකෘතිය ස්ථායි - අන්තරා - සංචාරි - අභෝග වශයෙනි

(iv) මාර්ග සංගීතය තුළින් බිහිවී ඇත

(v) ගායනය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබාදීම (___)

2 . 04 . 2018
පෙරදිග සංගීතය - I
13 ශ්‍රේණිය

(15) /සරිගග / ගගගග / ග - ගග / රිග ම -/ යනුවෙන් ආරම්භ වන්නේ,

(i) භාරතීය ජාතික ගීයයි (ii) බිලාවල් රාගයේ සර්ගමයයි

(iii) ශ්‍රී ලංකා ජාතික ගීයයි (iv) දූඩි කළ මාතා - පෙම්බර මාතා ගීයයි (___)

(16) සමප්‍රකෘති රාග යුගලයක් වන්නේ,

(i) බාගේශ්‍රී - භීම්පලාසි ය (ii) දේශ් - හමීර් ය

(iii) හමීර් - බහාර් ය (iv) බහාර් - ජයජයවන්ති ය

(v) ආශාවරී - ජෞන්පුරිය (___)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(17) එකස්වර (Melody) බහුස්වර (Harmony) යන සංකල්ප දෙකට වඩාත් ම ගැලපෙන සංගීත සම්ප්‍රදායන් දෙක කුමක් ද ?

(i) පෙරදිග සහ කර්ණාටක (ii) හින්දුස්ථානි සහ කර්ණාටක

(iii) හින්දුස්ථානි හා අපරදිග (iv) අපරදිග සහ පෙරදිග

(v) කර්ණාටක හා දේශීය (___)

(18) තිලක්කාමෝත් රාගය අයත් වන මේලය වන්නේ,

(i) ඛමාජ් ය (ii) ආශාවරිය (iii) බිලාවල්ය (iv) භෛරවීය (v) කාෆිය (___)

(19) අපරදිග සංගීතයෙහි මේජර් මයිනර් ස්කේල්ස් (Major Scale and Minor Scale) හා වඩාත් සමාන වන්නේ පිළිවෙලින්,

(i) බිලාවල් සහ ආශාවරී ථාට්ය (ii) ඛමාජ් සහ භෛරවී ථාට්ය

(iii) බිලාවල් සහ කාෆි ථාට්ය (iv) කාෆි සහ භෛරවී ථාට්ය

(v) බිලාවල් සහ භෛරවී ථාට්ය (___)

(20) ගද්‍ය හා පද්‍ය කොටස් ඇතුළත් ගැමි ගී විශේෂයකි.

(i) පතල් ගී (ii) පාරු ගී (iii) ගැල් ගී (iv) පැල් ගී (v) ටීකා සී පද (___)

(21) "කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා" යන්න

(i) ආඝාතාත්මක පැල් කවියකි (ii) ආනාඝාතාත්මක පැල් කවියකි

(iii) අනාඝාතාත්මක බඹර කවියකි (iv) අනාඝාත්මක පතල් කවියකි

(iv) ආඝාතාත්මක පතල් කවියකි (___)

(22) "සදාරංග - මෝගල් යුගය" සිහිපත් කෙරෙන සංගීතමය කරුණක් වන්නේ,

(i) ගසල් ය (ii) සන්තූර්ය (iii) ඛ්‍යාල්ය (iv) ශෙහෙනායි (v) ධ්‍රැපද්ය (___)


(23) දොලොවක් අතර චිත්‍රපටයට ඇතුළත් වූ කණ්ඩායම් සංගීත ආරේ ගීය කුමක්ද ?

(i) මල්බර හිමිදිරියේ (ii) වන දෙව්ලිය තුරුලේ

(iii) තරුණ ජීවිතේ අපේ විනෝදයෙන් (iv) ගයන ගැයුම් - නටන නැටුම්

(v) මුළු ගතම වෙහෙසුනා (___)

■ අංක 24 - 25 ප්‍රශ්නවලට පහත රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.




(24) D major කෝඩ් සඳහා යෙදෙන ස්වර තුනෙහි අංක පිළිවෙලින් මෙසේ දැක්වේ.

(i) 3 + 6 + 10 (ii) 5 + 8 + 12 (iii) 3 + 7 + 10

(iv) 1 + 5 + 9 (v) 2 + 6 + 13 (___)

(25) ඉහත අංක 7 ස්වරය විවාද ස්වරයක් වශයෙන් යොදාගන්නා රාගයකි.

(i) භාගේශ්‍රී (ii) බිහාග් (iii) ජෞන්පුරි

(ii) මාල්කෞන්ස් (v) බ්‍රින්දාමනී සාරංග (___)

(26) මාල් කෞන්ස් රාගය ______________ ථාට්යට අයත්වේ. එය ______________ ජාති රාගයකි.

(27) ඒක්තාලයට අයත් මාත්‍රා සංඛ්‍යාව ______________ කි. එහි එක් විභාගයට මාත්‍රා ______________ බැගින් යෙදේ.

(28) බටහිර සංගීතයට අනුව Soprano, ______________,Tenor, ______________ වශයෙන් මූලික හඬ හතරක් දැක්වේ.

(29) සොකරි නාටකය ______________ දෙවියන් හා සම්බන්ධය. එහි විශේෂ ලක්ෂණයක් වන්නේ ______________ මාධ්‍යයෙන් කතාවක් කීමය.

(30) පිලිප්පු සිංඤ්ඤෝ විසින් රචිත ප්‍රථම සිංහල නාඩගම වූයේ ______________ නාඩගමයි. මෙම සම්ප්‍රදාය සඳහා ______________ සංගීතයේ ආභාසය ලැබී ඇත.

2 . 04 . 2018
පෙරහුරු ඇගයීම
13 ශ්‍රේණිය

- අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට මෙම ස්වර ප්‍රස්ථාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රි | ම | ප | නි | ධ | ධ | ප | ප | ම | ප | ධ | ප | ග | ග | රි | ස |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

(31) ඉහත ස්වර රචනාවෙන් පිළිබිඹු වන රාගය නම් කරන්න.

______________________________

(32) එම රාගය ගැයීමට නියමිත ගාන සමය නම් කරන්න.

______________________________

(33) ඔබ විසින් නම් කළ රාගයට සමප්‍රකෘතිවන රාගයක නම ලියන්න.

______________________________

(34) මෙම රාගයේ අනුවාදී ස්වර නම් කරන්න.

______________________________

(35) සන්ධි ප්‍රකාශ රාගයක් වීමට බලපාන ප්‍රධාන සාධක ස්වර දෙක නම් කරන්න.

______________________________

- 36 - 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(36) තබ්ලාව සුසර කිරීමේදී ඉහළ - පහළ ගෙනයන ලීයෙන් තැනූ කොටස නම් කර, එය රඳවා ඇත්තේ කුමන කොටසේ දැයි ලියන්න.

______________________________

(37) සිතාරය සුසර කිරීමට යොදා ගන්නා විශේෂ උපකරණය කුමක්ද ?

______________________________

(38) සුනිල් ශාන්ත සූරීන් විසින් ගී තනු නිර්මාණය කළ චිත්‍රපටි දෙකක නම් ලියන්න.

______________________________

(39) නිශාදය දෙයාකාරයෙන් යෙදෙන රාග දෙකක් නම් කරන්න.

______________________________

(40) නාඩගම් සම්ප්‍රදාය ලංකාවට හඳුන්වා දුන් ද්‍රවිඩ සංගීතඥයා නම් කරන්න.

______________________________

(41) ම - ස වාදී සංවාදී වශයෙන් යෙදෙන රාග දෙකක් නම් කරන්න.

______________________________

(42) නිර්දේශිත ඖඩව සම්පූර්ණ රාග දෙකක් නම් කරන්න.

______________________________

(43) ආරෝහණයේදී 'රි' ස්වරය වර්ජිත නිර්දේශිත රාගයක් නම් කරන්න.

______________________________

(44) දේශ් රාගයට සමප්‍රකෘති රාගය කුමක්ද ?

______________________________

Learning Resource Center
R
De Mazenod College
Kandana

(45) දක්ෂිණ භාරතීය වර්ණම් ගායන ශෛලියෙහි ආකෘතියට අයත් කොටස් දෙකක් නම් කරන්න.

______________________________________________

(46) නාඩගම් ශෛලියේදී සාමාන්‍ය ලයට වඩා වැඩි ලයකින් ඉදිරිපත් කරන විශේෂිත කොටස හඳුන්වන නාමය කුමක්ද?

______________________________________________

(47) කෝලම් නාට්‍ය සම්ප්‍රදාය ලංකාව තුළ ප්‍රචලිතව තිබූ ප්‍රදේශය නම් කරන්න.

______________________________________________

(48) 'අශෝකමාලා' චිත්‍රපටියේ සංගීත නිර්මාණය සිදුකළ සංගීතඥයා කවරෙක්ද?

______________________________________________

(49) පෙරදිග සංගීතයේ සුළු මැදුම් දෙතිතට අනුරූප හින්දුස්ථානි තාලය කුමක්ද?

______________________________________________

(50) 'ඇඳුරුතුමා වන්න මගේ ' යන ගීතය ඇතුළත් සරච්චන්ද්‍රයන්ගේ ගීත නාටකය කුමක්ද?

______________________________________________

# ද මැසිනොද් විදුහල - කඳාන
# De Mazenod College – Kandana
## දෙවන වාර පරීක්ෂණය - 2018
## පෙරදිග සංගීතය II

13 ශ්‍රේණිය — කාලය: පැය 3 යි

2-04-2018

Learning Resource Centre
R
De Mazenod College
Kandana

I කොටස ප්‍රශ්න දෙකකට ද II එක් ප්‍රශ්නයකට ද III කොටසින් ප්‍රශ්න දෙකකට ද පිළිතුරු සපයන්න.

(පැය තුනයි)

(1) (i) පහත සඳහන් ආලාප ස්වර ඛණ්ඩ කුමන රාගවලට අයත්දැයි නම් කරන්න.

(a) රි ම ප නි, ධ ප, ම ප ධ, ම ප ග රි ස

(b) ම ග, ම ධ නි ධ ම, ග රි ස

(c) රි ග ම ප, නි ස̇, ස̇ නි ධ ප, රි ග රි ස

(d) රි ප ම ග රි නි̣ ස, නි̣ ප̣ නි̣ ස

(ii) දිවා දෙවන ප්‍රහරයේ ගැයෙන රාගයේ නම ලියා එහි රාග විස්තර ද සර්ගම් ගීතය ද ලියා දක්වන්න.

(iii) ඉතිරි රාග තුනෙන් එකකට අයත් මධ්‍යලය හින්දි ඛ්‍යාල් ගීයක් හෝ වාදිතයක් ලියා තානාලංකාර පහක් ලියා දක්යන්න.

(කෙටි තානාලංකාර තුනක් ද දිගු තානාලංකාර දෙකක් ද වන පරිදි විය යුතුය)

(2) (i) ශාඩව ජාතියට අයත් නිශාදය දෙආකාරයෙන් යෙදෙන රාගයේ ගීතයක් ප්‍රස්ථාර කරන්න.

(ii) එම ගීතයට ගැලපෙන තානාලංකාර පහක් ලියා දක්වන්න.

(කෙටි තානාලංකාර තුනක් ද දිගු තානාලංකාර දෙකක් ද වන පරිදි විය යුතුය)

(iii) එම රාගයේ ථාඨයෙන් වන වෙනත් රාගයක හින්දි මධ්‍යලය ගීතය ප්‍රස්ථාර කර දක්වන්න.

(3) (i) පහත කොටස්වල ගායන ශෛලීන් අතර සම විෂමකම් දක්වන්න.

(a) ධ්‍රැපද් - ධමාර්

(b) ගසල් - තරාණා

(i) ඉහත ගායන ශෛලීන් එකකට අයත් ගීතයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න.

(ii) ඛ්‍යාල් ගීතවලට වඩා ධ්‍රැපද් - ධමාර් ගීත ගායනා කිරීම අපහසු බව ශ්‍රී ලංකාවේ පිළිගත් මතයකි. මෙය විමසන්න.

## II කොටස

(4) (i) ලංකාවේ පළාත්බද වන්නම් ගීත සාහිත්‍ය තුළ අඩංගුව ඇති පුද්ගල හා සත්ව වර්ණනා පිළිබඳව විමර්ශනයක යෙදෙන්න.

(ii) ඔබ කැමති වන්නමක් ස්වර පද ප්‍රස්ථාර කරන්න.

(iii) එම වන්නම අයත් දේශීය තිත් පදය ප්‍රස්ථාර කොට එයට සමානවන හින්දුස්ථානි තාලය ද ප්‍රස්ථාර කරන්න.

(5) (i) දේශීය ජන ගීය වර්ගීකරණය වන අයුරු ගැලීම් සටහනකින් පෙන්වාලන්න. (එක් එක් ගී වර්ගයට අදාළ උදාහරණ තුන බැගින් ලියා දක්වන්න)

(ii) දේශීය තාලපද නම්කර (තනිතිත් හා දෙතිත්) ඊට අනුරූප හින්දුස්ථානි තාලපදය ද බටහිර තාලය ද නම් කරන්න.

(iii) පතල් ගීයෙන් හෙළිවන ගැමි ජනයාගේ අව්‍යාජ බව සිතුම් පැතුම්, ජීවන චර්යාවන් පිළිබඳව සාකච්ඡා කරන්න.

## III කොටස

(6) (i) පහත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග ශෛලීන් දෙකකට අදාළ තොරතුරු කිහිපයකි.

- ❖ උඩරට පළාතේ, වන්නියේ හා සතර කෝරළයේ ඇතැම් ප්‍රදේශවලට සීමාවූවකි.
- ❖ සබේ විදානේ චරිතයට ප්‍රධාන තැනක් හිමිවේ.
- ❖ පහතරට නර්තනයන්ගෙන් පෝෂණය වී ඇත.
- ❖ උඩරට ගැටබෙරය වාදනය කරයි.
- ❖ කථා පුවත පත්තිනි දෙවියන් හා සම්බන්ධයි.
- ❖ පිරිමින් විසින්ම ගැහැණු චරිත රඟ දක්වනු ලබයි.
- ❖ පාට වරුණ පුත පරමණ්ඩල පුත
- ❖ තනු රටා උඩරට ශාන්තිකර්ම හා සම්බන්ධ වේ.
- ❖ වෙස් මුහුණු භාවිතා කෙරේ.
- ❖ කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සශ්‍රීකත්වය මත බැඳී පවතියි.
- ❖ ගම්හිර කාලිංග නුවර නිරිඳුගෙ වාසල පුරයට.
- ❖ ස්වර වාද්‍ය භාණ්ඩයක් යොදා නොගනී.

| A<br>...........................රංග ශෛලිය | B<br>...........................රංග ශෛලිය |
|---|---|
| | |

(අදාල ආකෘතියට අනුව වගුව සකසා ගන්න)

2 - 04 - 2018
පෙරදිග සංගීතය II
13 ශ්‍රේණිය

Learning Resource Center
De Mazenod College
Kandana

(i) එම රංග ශෛලීන් දෙකේ නම් වගුවේ A – B අක්ෂර යටතේ ලියා නිවැරදිව වගුගත කරන්න.

(ii) ඉහත ශෛලීන් දෙක හැර ඔබ දන්නා වෙනත් රංග ශෛලියක ප්‍රචලිත ගීයක් ස්වර ප්‍රස්ථාර කර දක්වන්න.

(iii) එම ප්‍රස්ථාර කළ රංග ශෛලිය පිළිබඳව සංගීතමය ලක්ෂණ අටක් පැහැදිලි කරන්න.

7. (i) ව්‍යවහාරික සංගීත අංග සඳහා (සරල ගීත, චිත්‍රපට ගීත) රාගධාරි ශාස්ත්‍රීය සංගීත ආභාසය ලැබූ ගීත ලැයිස්තුවක් පිළියෙල කරන්න.

(ii) මින් හතරක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. මෙලඩි - හාර්මනි (Melody – Harmony)
2. මේජර් කෝඩ්ස් - මයිනර් කෝඩ්ස් (Major chords – Minor chords)
3. මධ්‍යම - පංචමභාවය
4. වයලීන් පවුල
5. ධමාර් ගායන ශෛලිය
6. ගසල් ගායන ශෛලිය

Learning Resource Center
De Mazenod College
Kandana

(iii) අංක (i) හි නම් කළ ඔබ කැමති ගීතයක් ගෙන ඒ පිළිබඳ රසාස්වාදයක යෙදෙන්න.

8. පහතින් ඇති බටහිර ස්වර ප්‍රස්තාරයට අනුව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) මෙම ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට ප්‍රස්තාර කර එය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියා දක්වන්න.

(ii) එහි මධ්‍යම භාවයෙන් ලියන ලද ප්‍රස්තාරයට සුදුසු පරිදි කෝඩ්ස් යොදන්න.